# රාජ්‍ය විශ්වවිද්‍යාලවල වයස අවුරුදු 30ට අඩු කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා එන්නත්කරණය සිදු කිරීම

සියළුම විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩලය වෙත,

විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවටම සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත පරිසරයක් සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. කොවිඩ් 19 පැතිරීම වැළැක්වීම සඳහා හොඳම විසඳුම් වනුයේ කොවිඩ් 19 සම්බන්ධ සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීම සහ කොවිඩ් 19 ට එරෙහිව එන්නත ලබා ගැනීමයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි රාජ්‍ය විශ්වවිද්‍යාල මඟින් වයස අවුරුදු 30ට අඩු කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා එන්නත් කිරීමේ වැඩසටහන් පැවැත්වෙන අතර ළඟම ඇති විශ්වවිද්‍යාල එන්නත්කරන මධ්‍යස්ථානය මඟින් එන්නත ලබා ගත හැකිය.

එන්නත් කිරීමේ මධ්‍යස්ථානයේදී ඔබගේ ජාතික හැඳුනුම්පත සහ විශ්වවිද්‍යාල හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඔබට නිදන්ගත රෝග හෝ අසාත්මිකතා තත්ත්වයන් ඇත්නම් කරුණාකර ඔබේ පවුලේ වෛද්‍යවරයාගෙන් හෝ එන්නත් ඒකකයේ වෛද්‍ය නිලධාරිගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගන්න.

දැනට කොවිඩ් මර්ධනය වෙනුවෙන් ලබා දෙනු ලබන සියළුම එන්නත් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් අනුමත කර ඇති අතර, එමගින් මෙම වෛරසය ශරිර ගතවිම අවම කරන මෙන්ම ඔබගේ ජීවිත අවදානම සහ රෝග ව්‍යාප්තිය වළක්වාලිමට මහඟු පිටුවහලක් සපයනු ඇත.

**සටහන :**
ඔබ කොවිඩ් 19 එන්නත ලබා ගැනීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට පැමිණෙන්නේ නම්,

- කරුණාකර පහත දක්වා ඇති WebLink භාවිතයෙන් වේලාවක් වෙන්කර නියමිත වේලාවට මිනිත්තු 10 කට පෙර එන්නත් මධ්‍යස්ථානයට පැමිණෙන්න.
- විශ්වවිද්‍යාල භූමිය තුල ඔබගේ ගමන් බිමන් හැකිතාක් සීමා කරන්න.
- එන්නත ලබා ගත් පසු කරුණාකර හැකි ඉක්මනින් විශ්වවිද්‍යාල භූමියෙන් ඉවත් වන්න.

**''අපි කොවිඩ් වලකමු, ඔබ ආරක්ෂා විමෙන් ඔබගේ ආදරණියන් ඇතුළුව අන් අය ද ඔබ ආරක්ෂා කරනු ලබයි.''**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය
2021.10.09